## ශ්‍රී ලංකා ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය - 2017

---

ශ්‍රී ලංකා ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 107(5) උප වගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. විශ්වවිද්‍යාල පනතේ 108(1) උප වගන්තිය ප්‍රකාර විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව සමග ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. විශ්වවිද්‍යාල පනතේ 108(2) උපවගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් විශ්වවිද්‍යාලයේ උපකුලපතිවරයා වෙත 2018 ජුනි 12 දින නිකුත් කරන ලදී.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

### 1.3 විගණකගේ වගකීම

---

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් විශ්වවිද්‍යාලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 111 වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

-------------------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

**2. මූල්‍ය ප්‍රකාශන**

------------------

**2.1 තත්ත්වාගණනය කළ මතය**

----------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

-------------------------------------------

**2.2.1. ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති**

---------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07

---------------------------------------------

(i) ප්‍රමිතයේ 65 ඡේදය ප්‍රකාරව, ජංගම නොවන වත්කම් සඳහා ඵලදායී ජීව කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් පිරිවැය රු.227,574,903 ක්වූ ස්ථාවර වත්කම් සම්පූර්ණයෙන් ක්ෂය කර ඇතත් තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුනි. ඒ අනුව වූ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 03 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ii) ප්‍රමිතයේ 87 (ඇ) ඡේදය ප්‍රකාරව, සමාලෝචිත වර්ෂය අවසානයට මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු රු.127,300,391 ක් වූ කෙරීගෙන යන වැඩ සම්බන්ධයෙන් ගිවිසුම්ගත වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව්කර නොතිබුණි.

**2.2.2 ගිණුම්කරණ අඩුපාඩු**

-------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) රාජ්‍ය ප්‍රදාන යටතේ මිල දී ගන්නා සියළුම ප්‍රාග්ධන වත්කම් ඒවායේ ප්‍රයෝජනවත් ජීවිත කාලය තුළ විලම්භිත ආදායමක් ලෙස ගිණුම්ගත කරන බවට ගිණුම්කරණ ප්‍රතිපත්ති යටතේ හඳුනාගෙන තිබුණ ද ප්‍රාග්ධන ප්‍රදාන යටතේ ඉදිකර තිබුණු ගොඩනැගිලි සඳහා සමාලෝචිත වර්ෂයේ ක්ෂය ලෙස රු.101,410,747 ක් ගිණුම්ගත කර තිබුණ ද එය විලම්භිත ආදායම් ලෙස ගිණුම්ගත කර නොතිබුණි.

(ආ) පසුගිය වර්ෂය සහ සමාලෝචිත වර්ෂය සඳහා ගෙවිය යුතු විගණන ගාස්තු වෙනුවෙන් ප්‍රතිපාදන සලසා නොතිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයට අදාල, විසි එක්වන සියවස සඳහා උසස් අධ්‍යාපනය ව්‍යාපෘතිය යටතේ ලද උපකරණ සහ පුස්තකාල පොත් පරිත්‍යාග ක්‍රමක්ෂය රු.1,404,609 ක් හා රු.8,016 ක් ලෙස එකතුව රු.1,412,625 ක් විය යුතු වුවත් මූල්‍ය ප්‍රකාශනවල එම වටිනාකම රු.1,194,372 ක් ලෙස දක්වා තිබීම හේතුවෙන් රු.218,253 කින් ක්‍රමක්ෂය අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි.

(ඇ) ගිවිසුම් කඩ කළ ආචාර්යවරුන් තිදෙනෙකුගෙන් සමාලෝචිත වර්ෂය අවසානයට අයවියයුතු රු.8,483,168 ක් ගිණුම් සටහන් මගින් හෙළිදරව් කිරීම වෙනුවට ලැබිය යුතු ශේෂ ලෙස මූල්‍ය ප්‍රකාශන වල දක්වා ගිවිසුම් කඩ කිරීමේ අරමුදලට බැර කර තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේදී ජංගම නොවන වත්කම් යටතේ දක්වා තිබුණු ලැබිය යුතු ශේෂයේ වැඩිවීම රු.3,322,477 ක් වුවද මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ කාරක ප්‍රාග්ධන වෙනස්වීම් යටතේ රු.3,294,054 ක් ලෙස දක්වා තිබීම හේතුවෙන් රු.28,423 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ඊ) ඉදිරි වර්ෂය සඳහා සමාලෝචිත වර්ෂයේදී ගෙවන ලද ඉන්ධන වියදම් දීමනා රු.122,790 ක් සමාලෝචිත වර්ෂයේ වියදමක් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(උ) විශ්වවිද්‍යාලයට ප්‍රවේශවීම සඳහා විකල්ප මාර්ග සංවර්ධන අදියර II ව්‍යාපෘතිය වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී ගෙවන ලද රු.1,801,476 ක් මූල්‍ය ප්‍රකාශනවල කෙරීගෙන යන වැඩ යටතේ දැක්වීම වෙනුවට වියදම් ලෙස කපාහැර තිබුණි.

(ඌ) සමාලෝචිත වර්ෂය අවසානයට සත්ත්ව විද්‍යා හා අපනයන කෘෂිකර්ම පීඨය යටතේ පවත්වාගෙන යන ගොවිපළේ සිටි සතුන්ගේ වටිනාකම රු.221,889 ක් මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කර නොතිබුණි.

### 2.2.3 පැහැදිලි නොකළ වෙනස්කම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය අවසානයට මූල්‍ය ප්‍රකාශන අනුව ලිපි ද්‍රව්‍ය තොගයේ වටිනාකම රු.6,161,546 ක් වුවද භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව එම වටිනාකම රු.6,025,451 ක් වූයෙන් රු.136,095 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ආ) මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය අවසානයට ස්ථාවර තැන්පතු ආයෝජන යටතේ දක්වා තිබුණු උපකුලපති අරමුදලේ සහ ගිවිසුම් කඩකිරීමේ අරමුදලේ ශේෂය රු.17,386,715 ක් වුව ද බැංකු ශේෂ සනාථන අනුව එම වටිනාකම රු.17,532,859 ක් වූයෙන් රු.146,144 ක පැහැදිලි නොකල වෙනසක් නිරීක්ෂණය විය.

(ඇ) 2005 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා එක් එක් වර්ෂවල මූල්‍ය ප්‍රකාශන අනුව, විශ්වවිද්‍යාලය විසින් අත්පත් කරගෙන තිබුණු හා විශ්ව විද්‍යාලයට ලැබී තිබුණු ස්ථාවර වත්කම්වල පිරිවැය රු.1,235,640,886 ක් වුවද ස්ථාවර වත්කම් ලේඛන අනුව එම ශේෂය රු.2,126,052,816 ක් වූයෙන් රු.890,411,930 ක වෙනසක් නිරීක්ෂණය විය.

**2.2.4 විගණනය සඳහා සාක්ෂි නොවීම්**

පහත සඳහන් ගිණුම් විෂයයන් ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවීය.

| ගිණුම් විෂයය | වටිනාකම | ඉදිරිපත් නොකළ සාක්ෂි |
|---|---|---|
| | රු. | |
| (අ) වෛද්‍ය සැපයුම් | 311,274 | තොග සමීක්ෂණ වාර්තා |
| (ආ) Chemical and Glassware | 23,562,128 | |
| | 23,873,402 | |

**2.3 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

පහත සඳහන් නීති රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| | නීති රීති හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම් |
|---|---|---|
| (අ) | 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත | |
| | 99 වගන්තිය | උසස් අධ්‍යාපන ආයතනයට අයිති වූ ද කවර ප්‍රභවයකින් හෝ අත්කරගනු ලැබුවා වූ ද සියලු මුදල් විශ්වවිද්‍යාල අරමුදලට බැර කළ යුතු වුවද, ඊට පටහැනි ලෙස විවිධ අරමුදල් යටතේ ලැබීම් ආයෝජනය කිරීම තුළින් සමාලෝචිත වර්ෂයේ දී ලැබී තිබුණු පොලී ආදායම් රු.1,853,970 ක් එම අරමුදල් වලට බැර කර තිබුණු අතර ගිවිසුම් කඩකල ආචාර්යවරයෙකුගෙන් ලැබුණු රු.1,558,095 ක් ගිවිසුම් කඩකිරීමේ අරමුදලට බැර කර තිබුණි. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| | (i) මුදල් රෙගුලාසි 570 හා 571 | විවිධ ඉදිකිරීම් සැපයුම් හා සේවා ලබා ගැනීමේ දී රඳවාගෙන තිබුණු වර්ෂ 02 ඉක්මවූ රු.13,346,065 ක් වූ තැන්පතු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |
| | (ii) මුදල් රෙගුලාසි 757(2) | සමාලෝචිත වර්ෂය සඳහා භාණ්ඩ සමීක්ෂණ වාර්තාව 2018 ජුනි 30 දින වන විටත් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. |

| | | |
|---|---|---|
| (ඈ) | රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ<br>------------------------------<br>2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | |
| | • 6.5.1 ඡේදය | සමාලෝචිත වර්ෂයේ කෙටුම්පත් වාර්ෂික වාර්තාවේ පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. |
| | • 7:2 ඡේදය | සියලුම රාජ්‍ය ව්‍යවසායයන් සතුව ප්‍රධාන මෙහෙයුම් ක්ෂේත්‍ර ආවරණය වන පරිදි මෙහෙයුම් අත්පොත් තිබිය යුතු වුවද විශ්වවිද්‍යාලය විසින් 2018 ජූනි 30 දින වන විටත් මෙහෙයුම් අත්පොතක් පිළියෙල කර නොතිබුණි. |
| (ඈ) | 2004 ජනවාරි 26 දිනැති අංක 2004/පුස්/01 දරන ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ චක්‍රලේඛය | මූල්‍ය ප්‍රකාශන අනුව, රු.64,220,660 ක් වූ පුස්තකාල පොත් සහ වාර සඟරා සම්බන්ධයෙන් සමීක්ෂණ වාර්තා 2018 ජූනි 30 දිනවන විටත් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. |
| (ඉ) | 2014 පෙබරවාරි 11 දිනැති අංක 02/2014 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛය | විශ්වවිද්‍යාලයේ අධ්‍යයන හා අනධ්‍යයන කාර්යමණ්ඩලයේ 456 දෙනෙකු සඳහා 2014 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා රු.62,496,364 ක පර්යේෂණ දීමනා ගෙවා තිබුණ ද නිලධාරීන් 454 දෙනෙකු පරීක්ෂණ කමිටුව වෙත වාර්තා ඉදිරිපත් කර නොතිබුණි. |
| (ඊ) | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ උසස් අධ්‍යාපන ආයතන සඳහා වූ ආයතන සංග්‍රහයේ X පරිච්ඡේදයේ 1.6.1 වගන්තිය සහ XX පරිච්ඡේදයේ 3(1) වගන්තිය | සමාලෝචිත වර්ෂය සඳහා අධ්‍යයන කාර්ය මණ්ඩලයේ පැමිණීම හා නිවාඩු තහවුරු කර නොගෙන වැටුප් හා දීමනා වශයෙන් රු.267,383,227 ක් ගෙවා තිබුණි. |
| (උ) | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ<br>-------------------------------------- | |
| | (i) 2013 අගෝස්තු 29 දිනැති අංක 12/2013 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සභාපතිවරයාගේ ආයතනික චක්‍රලේඛය | ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ට හිමි නිවාසවල 2014 වර්ෂයේ සිට පදිංචිව සිටින නිලධාරීන්ගෙන් චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව අයකරගත යුතු නිවාස කුලී සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් අයකර ගෙන නොතිබුණි. |
| | (ii) 2015 නොවැම්බර් 07 දිනැති අංක 15/2015 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සංස්ථාපිත චක්‍රලේඛය | විශ්වවිද්‍යාල අභ්‍යන්තර විභාග ප්‍රතිඵල, විභාගය පවත්වා මාස 03 ක් ඇතුළත නිකුත් කළයුතු වුවත් පසුගිය වර්ෂයේදී පවත්වන ලද විභාග 6 ක හා සමාලෝචිත වර්ෂයේ පවත්වන ලද විභාග 12 ක ප්‍රතිඵල නිකුත් කිරීමේදී මාස 01 සිට මාස 05 දක්වා වූ ප්‍රමාදයන් සිදුවී තිබුණි. |

| | | |
|---|---|---|
| **(ඍ)** | ජනාධිපති ලේකම්ගේ අංක සීඑස්ඒ/2/3/4 හා 2006 පෙබරවාරි 26 දිනැති ලිපිය සහ අංක සීඑස්ඒ/1/1/16 හා 2012 ජූනි 11 දිනැති ලිපිය | රාජකාරී කටයුතු සඳහා විදේශගතවන නිලධාරීන් විසින් අදාළ විදේශ සංචාරයෙන් ශ්‍රී ලංකා රජයට ලැබෙන ප්‍රතිලාභ ඇතුලත් වාර්තාවක් සංචාරය නිමවා දිවයිනට පැමිණ සති 2 ක් ඇතුලත ඉදිරිපත් කල යුතු වුවද සමාලෝචිත වර්ෂයේ දී විශ්වවිද්‍යාල අරමුදලෙන් රු.3,905,523 ක් වැයකර විදේශ සංචාරවල නිරත වූ ආචාර්යවරුන් 14 දෙනෙකු හා එක් නිලධාරියෙක් සහ රාජකාරි නිවාඩු මත විදේශගත වූ ආචාර්යවරු 07 දෙනෙකු විසින් අදාල වාර්තා ඉදිරිපත් කර නොතිබුණි. |

**2.4 ප්‍රමාණවත් අධිකාරි බලයකින් තහවුරු නොවූ ගනුදෙනු**

1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනත හා 2001 අගෝස්තු 24 දිනැති අංක ප්‍ර/ආයතන/11 දරන කම්කරු කොමසාරිස්ගේ ලිපිය ප්‍රකාරව, අධ්‍යයන දීමනාව ජීවන වියදම් දීමනාවක් ලෙස නිර්වචනය නොවන බැවින්, මෙම දීමනාව සේවක අර්ථසාධක අරමුදලට හා සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල් දායකත්වයට අදාළ කර නොගත යුතුය. එහෙත් එම විධිවිධානයට පටහැනිව , සමාලෝචිත වර්ෂයේ දී විශ්වවිද්‍යාලයේ පීඨ 04 ක අධ්‍යයන කාර්ය මණ්ඩලය වෙනුවෙන් රු.11,625,307 ක දායක මුදල් ඉහත අරමුදලට වැඩිපුර ගෙවා තිබුණි.

**3. මූල්‍ය සමාලෝචනය**

**3.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රතිඵලය රු.85,587,906 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.80,933,886 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.4,654,020 ක පිරිහීමක් පෙන්නුම් කෙරුණි. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ ආදායම රු.194,841,268 කින් වැඩි වී තිබුණ ද මුළු වියදම් රු.199,495,287 කින් වැඩිවීම නිසා පිරිහීමක් ඇති වී තිබුණි.

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂ 04 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේ දී 2013 වර්ෂයේ පැවති රු.88,412,661 ක ඌනතාවය වාර්ෂිකව උච්ඡාවචනය වී තිබූ අතර 2017 වර්ෂයේදී රු.85,587,906 ක ඌනතාවයක් ඇති වී තිබුණි. කෙසේ වුව ද, මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික හා ජංගම නොවන වත්කම් සඳහා ක්ෂය නැවත ගැළපීමෙන් පසු 2013 වර්ෂයේ විශ්වවිද්‍යාලයේ දායකත්වය රු.107,634,789 ක්වූ අතර එය සමාලෝචිත වර්ෂයේ දී රු.363,834,406 ක් දක්වා අඛණ්ඩව වර්ධනය වී තිබුණි.

**3.2 ආයතනයට එරෙහිව හෝ ආයතනය විසින් ආරම්භ කර ඇති නෛතික සිද්ධි**

දීර්ඝ කාලයක් සේවය කළ පුහුණුවන්නන් 08 දෙනෙකු විසින් විශ්වවිද්‍යාලයට එරෙහිව 2014 ජූලි 02 වැනි දින නඩුවක් පවරා තිබූ අතර ඒ සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශනවල අවශ්‍යා හෙළිදරව් කිරීම් සිදුකර නොතිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය
-------------------------------

### 4.1 කාර්යසාධනය
-----------------

#### 4.1.1 ක්‍රියාකාරීත්වය සහ සමාලෝචනය
--------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) විශ්වවිද්‍යාලය විසින් වර්ෂ 2016 – 2020 දක්වා වූ කාල පරිච්ඡේදය සඳහා පිළියෙල කර තිබුණු සංයුක්ත සැලැස්ම අනුව ළඟා කර ගැනීමට අපේක්ෂිත අරමුණු හා ඉලක්ක 06 ක් දක්වා තිබුණු අතර මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) 2016, 2017 වර්ෂවල උපාධි පාඨමාලා 13 ක් සඳහා සිසුන් 1,490 ක් බඳවාගත යුතු වුවද, සිසුන් 1,249 දෙනෙකු පමණක් බඳවාගෙන තිබුණි. ඒ අනුව බඳවා ගැනීමට අපේක්ෂිත ශිෂ්‍ය සංඛ්‍යාවෙන් සිසුන් 241 දෙනෙකු අඩුවෙන් බඳවා ගැනීම තුලින් සම්පූර්ණ ධාරිතාවය උපයෝජනය කර ගැනීමට විශ්වවිද්‍යාලය අපොහොසත් වී තිබුණි.

(ii) විශ්වවිද්‍යාලය විසින් 2010/2011 සහ 2011/2012 අධ්‍යයන වර්ෂ සඳහා බඳවාගනු ලැබූ ශිෂ්‍ය සංඛ්‍යාව 998 දෙනෙකු වූ අතර උපාධිය ලබා පිටවූ ශිෂ්‍ය සංඛ්‍යාව 860 දෙනෙකු විය. ඒ අනුව උපාධිය සම්පූර්ණ කර නොගත් ශිෂ්‍ය සංඛ්‍යාව ලියාපදිංචි මුළු ශිෂ්‍ය සංඛ්‍යාවෙන් සියයට 14 ක් විය.

(iii) ඉහළ ගුණාත්මක භාවයෙන් යුත් අන්තර්ජාතික මට්ටමේ පාඨමාලා, අවම පිරිවැයක් යටතේ හඳුන්වාදීම තුලින් බඳවාගනු ලබන විදේශීය ශිෂ්‍ය සංඛ්‍යාව ඉහළ නංවා ගැනීම අරමුණක් වී තිබුණ ද පසුගිය වර්ෂයේ දී හා සමාලෝචිත වර්ෂයේ දී එක් විදේශීය සිසුවෙකු බැගින් පමණක් බඳවාගෙන තිබුණි.

(iv) 2014 වර්ෂයේදී සියයට 77 ක් වූ සේවා නියුක්තිය 2017 වර්ෂයේදී 100 දක්වා වර්ධනය කර ගැනීමට ආයතනයේ අරමුණ වුවද, 2011/2012 අධ්‍යයන වර්ෂයට අදාළව සමාලෝචිත වර්ෂයේ දී උපාධිය ලබා පිටවූ උපාධිධාරීන්ගේ සේවා නියුක්තිය පිළිබඳ විශ්වවිද්‍යාලය මගින් සිදුකර තිබූ සංගණනයේ දී සේවා නියුක්තිය සියයට 62 සිට සියයට 74 දක්වා පරාසයක පැවතුනි.

(ආ) විශ්වවිද්‍යාලයේ පර්යේෂණ කමිටුව විසින් 2013 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා පර්යේෂණ ව්‍යාපෘති 33 ක් අනුමත කර ඒ වෙනුවෙන් රු.37,520,707 ක ප්‍රතිපාදන වෙන්කර තිබුණද ව්‍යාපෘති 21 ක් පමණක් ආරම්භ කර තිබුණු අතර ඉන් 20ක් නිමකර තිබුණි. එසේ වුවද මුළු ප්‍රතිපාදනයෙන් සියයට 56 ක් එනම් රු.21,027,409 ක් සමාලෝචිත වර්ෂය අවසානය වන විටද ඌන උපයෝජිතව පැවතුණි. කෙසේ වුවද, නිම කරන ලද ව්‍යාපෘති වාර්තා 20 පදනම් කරගෙන නව නිපැයුම් හෝ සේවා ජනිත කර ඒ සඳහා පේටන්ට් බලපත්‍ර ලබා ගැනීමට අවශ්‍ය වැඩ පිළිවෙලක් සකස් කර නොතිබුණි.

**4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්**

---

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) වර්ෂ 2010 සිට 2017 දක්වා කාලපරිච්ඡේදය තුල දී මිලදී ගෙන තිබුණු රු.593,799 ක් වටිනා තොග අයිතම් 17 ක් කල් ඉකුත් වී තිබුණු අතර විගණිත දිනය වූ 2018 ජූනි 30 දින වන විටත් එම තොග අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) විශ්වවිද්‍යාලය ස්ථාපිත කිරීම සඳහා කර්මාන්ත අමාත්‍යාංශයට අයත් ඉඩම අධ්‍යාපන අමාත්‍යාංශය වෙත පවරා ගැනීමට අදාළව 2008 පෙබරවාරි 10 දිනැති අමාත්‍ය මණ්ඩල පත්‍රිකා අංක 05/0183/035/001 යටතේ ගත් තීරණය අනුව, විශ්වවිද්‍යාලයට වෙන්කර තිබුණු හෙක්ටයාර් 30.9667 ක ඉඩම්වල අයිතිය මෙම වාර්තාවේ දින වන විටත් විශ්වවිද්‍යාලයට නීත්‍යානුකූලව පවරාගෙන නොතිබුණි.

(ඇ) විශ්වවිද්‍යාලයේ මූල්‍ය කමිටුවේ අනුමැතියකින් තොරව සමාලෝචිත වර්ෂයේදී රු.3,247,475 ක විදේශ ගමන් වියදම් දරා තිබුණි.

**4.3 මෙහෙයුම් ක්‍රියාකාරකම්**

---

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය තුල විශ්වවිද්‍යාලය විසින් නේවාසිකාගාර පහසුකම් සපයා තිබුණු සිසුන් 1,849 දෙනෙකු අතුරින් සිසුන් 841 දෙනෙකු හෙවත් සියයට 46 ක් සඳහා කුලී පදනම මත ලබාගත් නේවාසිකාගාර භාවිතා කර තිබුණි. සමාලෝචිත වර්ෂය අවසාන වන විට සිසුන් 506 දෙනෙකුට පහසුකම් ලබාදිය හැකි නේවාසිකාගාර 04 ක් පමණක් ස්ථාපිත කර තිබුණු අතර නේවාසිකාගාර පහසුකම් සැපයීම සඳහා කුලී නිවාස ලබාගැනීම වෙනුවෙන් 2015 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා කාලය තුලදී රු.21,638,235 ක් වැයකර තිබුණි. ඒ අනුව, විශ්වවිද්‍යාලය ආරම්භ කර වසර 12 ක් පමණ ගත වී තිබුණ ද ස්ථිර නේවාසිකාගාර ඉදි කිරීම සඳහා විශ්වවිද්‍යාලය විසින් අවධානය යොමු කර නොතිබුණු බව නිරීක්ෂණය විය.

(ආ) විශ්වවිද්‍යාලයේ ප්‍රවාහන කටයුතු වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ දී කුලී පදනම මත වාහන 14 ක් යොදාගෙන තිබුණු අතර ඒ වෙනුවෙන් රු.16,601,629 ක් වැයකර තිබුණි. එසේම පසුගිය වර්ෂ 04 ක කාලයක් සඳහා කුලිය වශයෙන් රු.65,055,751 ක් ගෙවා තිබුණු අතර විශ්වවිද්‍යාලය ස්ථාපිත කර, වසර 12 ක් ගත වී ඇතත් වාර්ෂික අයවැය ලේඛන මගින් ප්‍රතිපාදන සලසා ගැනීම තුළින් අත්පිට හෝ කල්බදු ක්‍රමය යටතේ වාහන මිලදී ගැනීමට කටයුතු කර නොතිබුණි.

**4.4 අරමුදල් ඌන උපයෝජනය**

---

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ඌව කර්මාන්ත කේන්ද්‍රීය අරමුදල, උපකුලපති අරමුදල සහ සුභසාධක අරමුදල යන අරමුදල්වල 2017 දෙසැම්බර් 31 දිනට එකතුව රු.4,314,079 ක ශේෂයක් වූ අතර වර්ෂය තුල කිසිදු කාර්යයක් සඳහා එම අරමුදල් උපයෝජනය කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේදී රාජ්‍ය ආයතන දෙකකින් හා එක් ව්‍යාපෘතියකින් විශ්වවිද්‍යාලයේ අධ්‍යයන පීඨ 02 ක විවිධ වැඩසටහන් සඳහා ලැබී තිබුණු රු.1,308,853 ක මුදලින් සියයට 20 ක් ප්‍රයෝජනයට නොගෙන ඉතිරි වී තිබුණි.

## 4.5 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

-----------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) විශ්වවිද්‍යාලය මගින් රු.2,043,499 ක් වැය කර ශිෂ්‍ය ඉගැනුම් ක්‍රියාකාරකම් වල යෙදවීමේ අරමුණින් 2016 වර්ෂයේ මිලදී ගෙන තිබුණු රෝද දෙකේ ට්‍රැක්ටර් රථය, රෝද හතරේ ට්‍රැක්ටර් රථය සහ නඟුල හා උපාංග සහ රු.6,270,760 ක් වැයකර සමාලෝචිත වර්ෂයේදී මිල දී ගෙන තිබුණු ඉගැනුම් හා කාර්යාල උපකරණ විගණිත දිනය වූ 2018 ජූනි 30 වන දින දක්වාම එම අරමුණ ඉටු කරගැනීම සඳහා භාවිතා කර නොතිබුණු බව විගණනයේ දී නිරීක්ෂණය විය.

(ආ) විශ්වවිද්‍යාලයේ එෆ් කොටසේ වෙන් කිරීම හා වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය (“Partition and Other Improvements to Block F” ) 2017 සැප්තැම්බර් 23 දින රු.16,952,719 ක ගිවිසුම්ගත මුදලකට ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශයට පවරා තිබුණු අතර විගණිත දිනය වූ 2018 මාර්තු 06 දිනට කල වැඩ වෙනුවෙන් රු.15,619,407 ක් කාර්යාංශයට ගෙවා තිබුණි. එසේ වුවද, විදුලි බල්බ සවිකරන ස්ථාන (Lamp Points) 34 ක් භාවිතයට ගැනීමට නොහැකි වන සේ සිවිලිම් සවිකර තිබුණු බව 2018 මාර්තු 06 වන දින සිදු කරන ලද ක්ෂේත්‍ර පරීක්ෂාවේ දී නිරීක්ෂණය විය. ඒ අනුව ඒ සඳහා වැයකල රු.187,000 ක් නිෂ්කාර්ය ගෙවීමක් ලෙස විගණනයේ දී නිරීක්ෂණය විය.

(ඇ) භාණ්ඩ මිලදී ගැනීමේ දී, අවශ්‍යතාවය හා ගබඩාවේ පවතින තොග මට්ටම කෙරෙහි අවධානය යොමුකර නොතිබීම හේතුවෙන් 2015 මැයි 21 දින හා සැප්තැම්බර් 11 වන දින මිලදී ගෙන තිබුණු A3 වර්ගයේ ඡායා පිටපත් කඩදාසි වලින් රු.653,193 ක් වටිනා ඡායා පිටපත් පැකට් 710 ක් විගණිත දිනය වූ 2018 මැයි 31 දින වන විටත් ප්‍රයෝජනයට නොගෙන ගබඩාවේ පැවතුනි.

(ඈ) තොග පාලන කටයුතු වෙනුවෙන් රු.165,000 ක් වැයකර 2016 නොවැම්බර් 24 දින මිලදී ගෙන තිබුණු පරිගණක මෘදුකාංගය 2017 දෙසැම්බර් 31 දින වන විටත් තොග පාලන කටයුතු සඳහා යොදාගෙන නොතිබුණි.

## 4.6 ආර්ථික නොවන ගනුදෙනු

--------------------------------

විශ්වවිද්‍යාලය කුලී පදනම මත වාහන සැපයුම්කරුවන් සමග එළඹ තිබුණු ගිවිසුම අනුව කුලී වාහන රියදුරන් සඳහා නවාතැන් පහසුකම් සැපයීමට එකඟ වී නොතිබුණ ද එම රියදුරන්ට නවාතැන් පහසුකම් සැපයීම වෙනුවෙන් කුලී පදනම මත ලබාගත් නිවාසයක් ලබාදී ඒ වෙනුවෙන් සමාලෝචිත වර්ෂය තුළදී රු.240,000 ක් විශ්වවිද්‍යාලයේ අරමුදල් මගින් වැයකර තිබුණි.

**4.7 කාර්යමණ්ඩල පරිපාලනය**

**-------------------------------**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අධ්‍යයන කාර්යමණ්ඩලය

-----------------------------

(i) 2006 වර්ෂයේදී 10 ක් වූ විශ්වවිද්‍යාලයේ අනුමත මහාචාර්ය තනතුරු සංඛ්‍යාව 2017 වර්ෂයේ දී 05 දෙනෙකු දක්වා අඩුකර තිබුණු අතර 2015 වර්ෂයේ සිට පුරප්පාඩුව පැවති එම තනතුරු පිරවීමට සමාලෝචිත වර්ෂයේදී ද කටයුතු කර නොතිබුණි.

(ii) ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ අනුමත කථිකාචාර්ය තනතුරු වලින් විශාල සංඛ්‍යාවක් විශ්වවිද්‍යාලය ආරම්භයේ සිටම පුරප්පාඩුව පවතින අතර අනුමත තනතුරු 275 කින් තනතුරු 83 ක් සමාලෝචිත වර්ෂයේ අවසානයට පුරප්පාඩුව පැවතුණි.

(ආ) පරිපාලන හා අනධ්‍යයන කාර්යමණ්ඩලය

---------------------------------------------

(i) 2006 ජුනි 06 දිනැති අංක 876 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ චක්‍රලේඛය ප්‍රකාරව විශ්වවිද්‍යාලයේ පරිපාලන හා අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ තනතුරු 77 ක් සඳහා නිලධාරීන් බඳවා ගෙන නොතිබුණි.

(ii) විශ්වවිද්‍යාලයේ පුස්තකාලාධිපති තනතුර විශ්වවිද්‍යාලය ආරම්භයේ සිටම පුරප්පාඩුව පවතින අතර 2017 ජුලි 21 දින පැවති 123 වන පාලක සභා රැස්වීමේ අනුමැතිය මත සප්ත වාර්ෂික නිවාඩු ලබා සිටින රජරට විශ්වවිද්‍යාලයේ පුස්තකාලාධිපති 2017 අගෝස්තු 01 දින සිට 2018 ජූලි 31 දින දක්වා රු. 150,000 ක දීමනාවක් මත පුස්තකාලාධිපති ලෙස පත්කර තිබුණි. අනතුරුව 2017 දෙසැම්බර් 22 දින පැවති 128 වන පාලක සභා රැස්වීමේ තීරණය මත අනුමත කාර්යය මණ්ඩලයට ඇතුළත් නොවූ පුස්තකාල උපදේශක තනතුරක් සඳහා එම නිළධාරිනිය 2018 ජනවාරි 01 දින සිට රු. 225,000 ක දීමනාවක් මත පත්කර තිබුණි. ඒ අනුව පුස්තකාලාධිපති තනතුර පුරප්පාඩුව පැවතිය දී අනුමත කාර්ය මණ්ඩලයට ඇතුළත් නොවන පුස්තකාල උපදේශක තනතුරක් සඳහා බඳවා ගෙන තිබුණි.

(iii) විශ්වවිද්‍යාලයේ ඉංජිනේරු තනතුර විශ්වවිද්‍යාලය ආරම්භයේ සිට විගණිත දිනය වූ 2018 ජුනි 30 දින දක්වා පුරප්පාඩුව පැවති අතර එම තනතුර සඳහා ඌව පළාත් සභා ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ඉංජිනේරුවරයා 2015 දෙසැම්බර් 02 දින සිට මාසිකව රු.50,000 ක දීමනා මත අර්ධ කාලීනව පත්කර තිබුණි.

(iv) විශ්වවිද්‍යාලය විසින් 2017 වර්ෂයට පෙර ට්‍රැක්ටර් 02 ක් ද 2017 වර්ෂය තුල බස්රථ 03 ක්ද මිලදී ගෙන තිබුණු නමුත් අනුමත කාර්ය මණ්ඩලයට ඇතුලත් කර ස්ථිර රියදුරන් බඳවා ගැනීමට කටයුතු නොකර විශ්වවිද්‍යාලයේ ශ්‍රම සැපයුම් වැඩසටහන යටතේ දෛනික දීමනා මත පුද්ගලයන් හතර දෙනෙකු රියදුරන් ලෙස බඳවාගෙන තිබුණි.

## 5. තිරසාර සංවර්ධනය

## 5.1 තිරසාර සංවර්ධන අරමුණු හා ඉලක්ක ලඟා කර ගැනීම

2017 අගෝස්තු 14 දිනැති අංක එන්පී/එස්පී/එස්ඩීජී/17 දරන තිරසාර සංවර්ධනය පිළිබඳ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශයේ ලේකම් විසින් නිකුත් කරන ලද ලිපිය හා තිරසාර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ සංවිධානයේ "2030 න්‍යාය පත්‍රය" ප්‍රකාරව සමාලෝචිත වර්ෂයට අදාලව විශ්වවිද්‍යාලය විසින් තම විෂය පථය යටතට ගැනෙන කාර්යයන් සම්බන්ධයෙන් කෙසේ ක්‍රියාත්මක විය යුතුද යන්න පිළිබඳව දැනුවත් වී තිබුණ ද තිරසාර සංවර්ධන අරමුණු හා ඉලක්ක හඳුනා ගැනීම හා තිරසාර සංවර්ධන අරමුණු හා ඉලක්ක මැනීම සඳහා දර්ශක හඳුනා ගැනීම සිදුකර නොතිබුණි.

## 6. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

## 6.1 ප්‍රසම්පාදනය හා කොන්ත්‍රාත් ක්‍රියාවලිය

### 6.1.1 ප්‍රසම්පාදනයන්

සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කරන ලද ප්‍රසම්පාදන සැලැස්ම සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ප්‍රසම්පාදන ප්‍රගති වාර්තාව අනුව සමාලෝචිත වර්ෂය හා ඊට පෙර ආරම්භකර ක්‍රියාත්මක කර තිබුණු ඇස්තමේන්තු වටිනාකම රු.114,811,098 ක්වූ ප්‍රසම්පාදන කටයුතු 72 ක් සමාලෝචිත වර්ෂයේ ප්‍රසම්පාදන සැලැස්මට හෝ සංශෝධිත ප්‍රසම්පාදන සැලැස්මට ඇතුළත් කර නොතිබුණු අතර ඉන් රු.87,184,465 ක් වටිනා ප්‍රසම්පාදන කටයුතු 46 ක් සමාලෝචිත වර්ෂයේ අවසානය වන විටත් නිමකර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුල නිමකිරීමට සැලසුම් කර තිබුණු රු.505,000,000 ක් වටිනා ප්‍රසම්පාදන 134 කින් රු.163,506,415 ක් වටිනා ප්‍රසම්පාදන 39 ක් නිමකර නොතිබුණි.

### 6.1.2 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) නේවාසිකාගාර සහ කාර්යමණ්ඩලය සඳහා නිවාස 75 ක් කුලියට ලබා ගැනීම වෙනුවෙන් 2016 සැප්තැම්බර් 12 දින ප්‍රසිද්ධ කරන ලද ප්‍රසම්පාදන දැන්වීමේ කොන්දේසි 2.6 ප්‍රකාරව, රජයේ ඇස්තමේන්තු තක්සේරු කුලිය හා ඉදිරිපත් වන කුලිය සලකා බලා ගෙවිය යුතු කුළිය තීරණය කල යුතු වුවත් කුලියට ලබාගත් නිවාස 13 ක් සඳහා රජයේ තක්සේරු කුලියට වඩා මාසිකව රු.112,100 ක් වැඩිපුර ගෙවා තිබුණි. තවද රජයේ ඇස්තමේන්තු තක්සේරු කුලිය ලබා නොගෙන නිවාස 12 ක් වෙනුවෙන් මාසික කුලිය රු.775,070 ක් ගෙවා තිබුණි.

(ආ) 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන අනුගමනය කිරීමකින් තොරව මාසික කුලී වටිනාකම රු.681,282 ක් වන නිවාස 15 ක් 2017 වර්ෂයේ අවස්ථා කිහිපයකදී නේවාසිකාගාර ලෙස හා මාසික කුලිය රු. 47,000 ක් හා රු. 27,500 ක් බැගින් නිවාස දෙකක් සංචාරක නිවාස වෙනුවෙන් වසරක කාලයක් සඳහා කුලියට ලබාගෙන තිබුණි.

(ඇ) නේවාසිකාගාර හා නිල නිවාස සඳහා නිවාස තෝරා ගැනීමේදී එම නිවාස වලට අදාල අනුකූලතා සහතික පිළිබඳ අවධානය යොමු කර නොතිබුණු අතර තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් ඇගයීම සඳහා යොදාගත් නිවාසවල ක්ෂේත්‍ර පරීක්ෂාවක් සිදු කළ බවට සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේ දී විශ්වවිද්‍යාලයට එකක් රු.5,400,000 බැගින් රු.10,800,000 ක් ගෙවා බස් රථ දෙකක් 2017 දෙසැම්බර් 07 දින පෞද්ගලික සමාගමකින් මිලදී ගෙන තිබුණි. ඒ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) ප්‍රසම්පාදනය සඳහා පිළියෙළ කළ පිරිවිතර ප්‍රකාරව 2017 වර්ෂයේ නිෂ්පාදිත බස් රථ මිලදී ගත යුතු වුවත් 2016 වර්ෂයේ නිෂ්පාදිත බස් රථ දෙකක් මිලදී ගෙන තිබුණි.

(ii) මෝටර් රථ පරීක්ෂකගේ නිර්දේශය පරිදි කඳු සහිත මාර්ග පද්ධතියට වඩාත් යෝග්‍ය ඇලුමිනියම් බඳ සහිත ආසන 58 ගියර් 06 ඇලුමිනියම් තට්ටුව සහිත බස් රථ කෙරෙහි අවධානය යොමු කිරීම වෙනුවට ෆයිබර් මිශ්‍රිත බඳ සහිත බස් රථ කෙරෙහි පමණක් අවධානය යොමු කර තිබුණි.

(ඉ) කාර්යමණ්ඩල නිල නිවාස සඳහා ගෘහ භාණ්ඩ මිලදී ගැනීමේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය 2016 ඔක්තෝබර් 14 දින ආරම්භකර මිල ගණන් කැඳවා තිබුණද නියමිත කාල වකවානුව තුල තාක්ෂණික ඇගයීමේ කමිටුව ක්‍රියාත්මක නොකිරීම නිසා සමාලෝචිත වර්ෂයේ දී ගෘහ භාණ්ඩ මිලදී ගැනීම සඳහා රු.589,500 ක අමතර පිරිවැයක් දැරීමට සිදු වී තිබුණි.

(ඊ) 2006 වර්ෂයේ විශ්වවිද්‍යාලය පිහිටුවීමේ පළමු වන අදියර යටතේ රු. මිලියන 350 ක් වටිනා ගොඩනැගිලි ඉදි කිරීමේ කොන්ත්‍රාත්තුව අමාත්‍ය මණ්ඩල පත්‍රිකා අංක 05/0536/035 හා 2005 අප්‍රේල් 21 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණ ප්‍රකාර නිර්මාණය කර ඉදි කිරීමේ ක්‍රමයට ඉටු කිරීමට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් ප්‍රසම්පාදන ක්‍රියාවලියෙන් බැහැරව ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය තෝරා ගෙන තිබුණි.
මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය කෙරේ.

(i) ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය සමඟ ගිවිසුමකට එළඹීමකින් තොරව නිර්මාණය කර ඉදිකිරීමේ ක්‍රමයට ඉදිකිරීම් සිදු කිරීම සඳහා 2005 ජූනි 09 වන දින සිට 2005 දෙසැම්බර් 31 දින දක්වා අවස්ථා 05 කදී රු.138,217,390 ක් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් කොන්ත්‍රාත්කරුට ගෙවා තිබුණි.

(ii) 2006 අගෝස්තු 21 වන දින විශ්වවිද්‍යාලය විසින් ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය සමග නිර්මාණය කර ඉදිකිරීමේ ක්‍රමයට ඉදිකිරීම් සිදු කිරීම සඳහා මුළු වැඩ වටිනාකම රු.284,273,405 ක ගිවිසුමකට එළඹ තිබුණු අතර ගිවිසුමට එළඹීමට පෙර 2006 පෙබරවාරි 06 වන දින සිට 2006 මැයි 31 වන දින දක්වා අවස්ථා 05 කදී රු.84,890,797 ක් විශ්වවිද්‍යාලය මගින් ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශයට ගෙවා තිබුණි. එසේ වුවද විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් විශ්වවිද්‍යාලයට ඉහත කොන්ත්‍රාත්තුවේ පරිපාලන කටයුතු පැවරීමට හේතු වූ කරුණු විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

(iii) මෙම ඉදිකිරීම සඳහා 2005 අප්‍රේල් 21 දිනැති 05/ 0536/ 035අංක දරන අමාත්‍ය මණ්ඩල තීරණ අනුව නිර්මාණය කර ඉදිකිරීම් ක්‍රමයට කොන්ත්‍රාත්කරු සමග ගිවිසුම් ගත වී තිබියදී ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය විසින් නිකුත් කරන ලද CIDA/SDB/04 න් 14.1.(ආ) වගන්තිය පරිදි මිල ගැලපුම් සඳහා ගෙවීම් නොකල යුතු වුවද ඊට පටහැනි ලෙස මිල විචලනයන් ලෙස රු.28,427,341 ක් කොන්ත්‍රාත්කරු වෙත ගෙවීම් කර තිබුණි.

(iv) කොන්ත්‍රාත්කාර සමාගමෙන් ප්‍රමාද දඩ වශයෙන් රු.2,250,000 ක් අයකර ගෙන තිබුණ ද ගණනය කිරීම් පිළිබඳ විස්තර විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

(v) 2006 අගෝස්තු 21 වන දින විශ්වවිද්‍යාලය ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය සමග එළඹුණු ගිවිසුම අනුව වැඩ කොටස් 05 ක් සඳහා රු.284,273,405 ක මුදලකට ගිවිසුම්ගත වී තිබුණ ද 2015 නොවැම්බර් 16 වන දින අවසාන ගෙවීම් වාර්තාවේ වැඩ කොටස් 06 ක් ඇතුළත් කර ගිවිසුම්ගත නොවූ වැඩ කොටස් සඳහා රු.44,123,115 ක් කොන්ත්‍රාත්කරුට ගෙවා තිබුණි.

## 6.3 අයවැය පාලනය

--------------------

ඇස්තමේන්තුගත ආදායම්, තත්‍ය ආදායම් සමග සැසඳීමේ දී අය විෂයයන් 04 ක සියයට 15 සිට සියයට 151 දක්වා සැලකිය යුතු විචලනයක් නිරීක්ෂණය වූ අතර ඇස්තමේන්තුගත වියදම්, තත්‍ය වියදම් සමඟ සැසඳීමේදී වැය විෂයයන් 13 ක සියයට 20 සිට සියයට 119 දක්වා වූ සැලකිය යුතු විචලනයන් නිරීක්ෂණය විය. එසේම ප්‍රාග්ධන වියදම් යටතේ ඉඩම් අත්පත් කර ගැනීම සඳහා ගෙවන ලද වියදම අයවැය ඇස්තමේන්තු පිළියෙල කිරීමේදී හඳුනාගෙන නොතිබුණි. ඒ අනුව අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

## 6.4 පාරිසරික හා සමාජ වගකීම් ඉටු කිරීම

----------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2008 පෙබරවාරි 01 දිනැති අංක 1534/18 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළවන කොටස ප්‍රකාරව අපද්‍රව්‍ය මෝචනය හෝ බැහැර කිරීම සඳහා පරිසර ආරක්ෂණ බලපත්‍රයක් ලබාගෙන ඊට අදාළ කටයුතු සිදුකළ යුතු වුවත් විශ්වවිද්‍යාලයේ විද්‍යාගාර වල භාවිතා කර ඉවත් කරනු ලබන රසායන ද්‍රව්‍ය බැහැර කිරීම් සඳහා එවැනි බලපත්‍රයක් ලබා ගෙන ඊට අනුකූලව කටයුතු කිරීම වෙනුවට විශ්වවිද්‍යාල භූමියේ සකස් කරන ලද වලකට ජලය සමග මිශ්‍ර කර බැහැර කර තිබුණි.

(ආ) විශ්වවිද්‍යාලයේ පසුගිය වර්ෂ 03 ක ජල පරිභෝජනය වෙනුවෙන් රු.13,537,151 ක වියදමක් දරා තිබුණි. විශ්වවිද්‍යාලයේ විවිධ අංශ විසින් බැහැර කරන අපවිත්‍ර ජලය, අපජල පිරිපහදු පද්ධතිය මගින් පිරිසිදු කර බැහැර කිරීම සිදු කර තිබුණද මෙම ජලය වාහන සේදීමට හා වෙනත් නඩත්තු කටයුතු සඳහා යොදා ගෙන ජලය සඳහා වැයවන පිරිවැය අඩුකර ගැනීම සම්බන්ධයෙන් කළමනාකරණයේ අවධානය යොමුවී නොතිබුණි.

## 7. පද්ධති හා පාලනයන්

විගණනයේ දී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර විශ්වවිද්‍යාලයේ උපකුලපතිවරයාගේ අවධානයට යොමු කරවන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් පිළිබඳව විශේෂ අවධානය යොමුකළ යුතුවේ.

| | පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|---|
| (අ) | ගිණුම්කරණය | ගිණුම්කරණ අඩුපාඩු හා නොසැසඳූ ගිණුම් පැවතීම. |
| (ආ) | වත්කම් කළමනාකරණය | ස්ථාවර වත්කම් ප්‍රත්‍යාගණනය නොකිරීම, ස්ථාවර වත්කම් ලේඛන නිසි පරිදි නඩත්තු නොකිරීම. |
| (ඇ) | ගබඩා පාලනය | දුර්වල තොග කළමනාකරණය. |
| (ඇ) | කාර්ය මණ්ඩල පරිපාලනය | තනතුරුවල පුරප්පාඩු පැවතීම හා අතිරික්ත සේවකයින් සිටීම |